විසර්ජන ශීර්ෂය : 316 - වයඹ පළාත් සභාව - විගණකාධිපති වාර්තාව - 2012

1. මෙහෙවර හා ප්‍රධාන කාර්යයන්

(අ) මෙහෙවර

වයඹ ජනතාවට වඩා උසස් ජීවන තත්ත්වයක් උදාකරදීම සඳහා කාර්යක්ෂම ඵලදායී ගුණාත්මක සේවාවක් සැලසීමට ඇපකැප වීම.

(ආ) ප්‍රධාන කාර්යයන්

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අටවන උපලේඛනයේ සඳහන් කාර්යයන් ඉටුකිරිම.

2. වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

වයඹ පළාත් සභාව විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් ගිණුම් වර්ෂය ආරම්භයේ පිළියෙල කර 2011 අංක 4 දරන විසර්ජන ප්‍රඥප්තිය නමින් ඉදිරිපත් කර තිබුණි.

3. විසර්ජන ගිණුම

(අ) ගිණුම් ඉදිරිපත් කිරිම

විසර්ජන ශීර්ෂ.316 දරන වයඹ පළාත් සභාවේ විසර්ජන ගිණුම 2013 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) මුළු ප්‍රතිපාදනය හා වියදම

සමාලෝචිත වර්ෂයේ පළාත් සභාව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.14,937,070,000 ක්වූ අතර, වර්ෂය අවසානය වන විට ඉන් රු.13,377,671,500 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.1,559,398,500 ක් වී තිබුණු අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදමේ ස්වභාවය | වාර්ෂික මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනය | සියළු ගැලපීම් කිරීමෙන් පසු ශුද්ධ පතිපාදනය | තථ්‍ය වියදම (2012.12.31දිනට) | ඉතිරිය (2012.12.31දිනට) | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 12,651,070,000 | 12,770,070,000 | 12,261,101,500 | 508,968,500 | 4 |
| මූලධන | 2,156,000,000 | 2,167,000,000 | 1,116,570,000 | 1,050,430,000 | 48 |
| එකතුව | 14,807,070,000 | 14,937,070,000 | 13,377,671,500 | 1,559,398,500 | 10 |